# කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී විශේෂ උපාධි සතරවන වසර පරීක්ෂණය

## දෙවන සෙමෙස්තරය - 2017/2018

## BST 4285 – ලෝක ආගම් පිළිබඳ අධ්‍යයනය

(පැ දෙකයි)

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න **තුනකට (03) පමණක්** පිළිතුරු සපයන්න.

---

### I කොටස

1. ආගමික මූලධර්මවාදය ප්‍රතික්ෂේප කිරීමෙහි ලා තුලනාත්මක ආගම් අධ්‍යයනයේ පවත්නා උපයෝගීතාව විශද කරන්න.

2. ආගම මානව ඥානයේ ආදිතම අවස්ථාව සේ සැලකිය හැකි වුව ද එය වර්තමාන සමාජ යහපත වෙනුවෙන් සාධනීය ලෙස යොදාගත හැකි ආකාරය විමර්ශනය කරන්න.

### II කොටස

3. "ජුදා පසුබිම තුළ ජේසුතුමා දේශනා කරන්නට යෙදුණේ තමන්ගේ පාරම්පරික දහමට විකල්පවාදීවය. එය ආගමික ව්‍යාපාරයක් ලෙස ජීවිත කාලයේදී ද, පසුව කිතුනු දහම ලෙස ලෝක ව්‍යාප්ත වන්නේ ද ඔහුගේම ජීවිත සාක්ෂිය බව කිතුනුවෝ අදහති".

   ඉහත ප්‍රකාශය නාසරෙත්හි ජේසුස්ගේ ජීවිතය, ප්‍රතිපදාව, මරණය, දේශනා සහ පුනරුත්ථානය පිළිබඳ කිතුනු ඉගැන්වීම් ඇසුරින් සාකච්ඡා කරන්න.

4. i) කිතුනු දහමේ සක්‍රමේන්තු යනු කිතුනුවන්ගේ ජීවිත චක්‍රය හා සබැඳුණු මාර්ග ඵල ලෙස හැඳින්විය හැකිය. ඒවා කවරාකාරව ඔවුන් තම ධාර්මික ගුණ වගාවට රුකුලක් ලෙස භාවිත කරන්නේ දැයි සාකච්ඡා කරන්න.

ii. ගැලවීම හුදෙක් මරණයෙන් පසු ලබන්නා වූ ලෝකෝත්තර තත්ත්වයක් පමණක් නොව, කිතුනුවකු ලෙස තමන් අන් දනන් සමග දිවි ගෙවනා ලෝකය තුළම අත්විඳිය හැකි විමුක්තිය ආගමික අනුභූතියක් ලෙස ද ඔවුහු හඳුන්වති. "දකින සහෝදරයාට කරන සේවය නොදකින දෙවියන් හටම සිදුකරන්නා වූ ගෞරව වන්දනාවකි".

ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

III කොටස

5. ඉස්ලාම් ආගමෙහි පල්ලියක කාර්යභාරය කුමක්දැයි විස්තර කරන්න.

6. ඉස්ලාම් ආගමෙහි විශ්වාසය සහ ක්‍රියාව අතර පවත්වන සම්බන්ධතාව කුමක්දැයි සාකච්ඡා කරන්න.

*******************************